# අල් කුර්ආන්
# 06 සූරත් අල්-අන්ආම් (ගොවිපළ සතුන්)
# දක්වා59 සිට 01වාක්‍ය

< سنهالي- සිංහල- Sinhala >

අල් කුර්ආන්


භාෂා පරිවර්තක
මාහිර් රම්ඩීන්

සංස්කාරක
මුහම්මද් අසාද්

# ترجمة القرآن الكريم

# سورة الأنعام من الآية 01 حتى 59

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد ومجموعة من العلماء والترجمين

## 06 සූරත් අල්-අන්ආම් (ගොවිපළ සතුන්)

මක්කාවෙහි දී පහළ වූවකි. ආයත් 165 කි.

بِسْمِ اللّٰهِ الرَّحْمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

### 1-3. මැවීම් හා පරිපාලනයෙහි අල්ලාහ්ගේ බලය පිළිබඳ විග්‍රහය හා එය තහවුරු කරන විශ්වයේ හා මිනිසුන් තුළ පවතින සාක්ෂීන්

الْحَمْدُ لِلَّهِ الَّذِي خَلَقَ السَّمَاوَاتِ وَالْأَرْضَ وَجَعَلَ الظُّلُمَاتِ وَالنُّورَ ثُمَّ الَّذِينَ كَفَرُوا بِرَبِّهِمْ يَعْدِلُونَ (1)

සියලු ප්‍රශංසා අල්ලාහ්ටමය. ඔහු අහස් හා මිහිතලය මැව්වේය. තවද අන්ධකාරයන් හා ආලෝකය ඇති කළේය. පසුව (මෙසේ තිබිය දී) ප්‍රතික්ෂේපකයින් ඔවුන්ගේ පරමාධිපතිට (වෙනත් දෑ) සමාන කරති.

هُوَ الَّذِي خَلَقَكُمْ مِنْ طِينٍ ثُمَّ قَضَى أَجَلًا وَأَجَلٌ مُسَمًّى عِنْدَهُ ثُمَّ أَنْتُمْ تَمْتَرُونَ (2)

නුඹලා මැටියෙන් මවා පසුව නියමිත කාලයක් ද තීන්දු කළේ ඔහු ය. (විනිශ්චය සඳහා වූ) නියමිත කාලය ඇත්තේ ද ඔහු අබියසය. ඉන් පසුව ද නුඹලා සැක කරන්නෙහුය.

وَهُوَ اللَّهُ فِي السَّمَاوَاتِ وَفِي الْأَرْضِ يَعْلَمُ سِرَّكُمْ وَجَهْرَكُمْ وَيَعْلَمُ مَا تَكْسِبُونَ (3)

තවද අහස්හි හා මිහිතලයේ අල්ලාහ් ඔහුය. නුඹලාගේ රහස්‍ය දෑ ද නුඹලාගේ ප්‍රසිද්ධ දෑ ද ඔහු දන්නේය. නුඹලා උපයන දෑ ද ඔහු දන්නේය.

### 4-6. අල්-කුර්ආනය හා ඉස්ලාමය පිළිබඳ ව වූ ප්‍රතික්ෂේපකයින්ගේ ස්ථාවරය.

وَمَا تَأْتِيهِمْ مِنْ آيَةٍ مِنْ آيَاتِ رَبِّهِمْ

තම පරමාධිපතිගේ වදන් තුළින් කවර වදනක් ඔවුන් වෙත පැමිණිය ද එය ඔවුහු පිටුපාමින්

إِلَّا كَانُوا عَنْهَا مُعْرِضِينَ (4)

සිටියා මිස නැත.

فَقَدْ كَذَّبُوا بِالْحَقِّ لَمَّا جَاءَهُمْ فَسَوْفَ يَأْتِيهِمْ أَنْبَاءُ مَا كَانُوا بِهِ يَسْتَهْزِئُونَ (5)

ඒ අනුව සත්‍යය ඔවුන් වෙත පැමිණි කල්හි ඔවුහු එය බොරු කළෝය. ඔවුහු කවර දෙයක් පිළිබඳ ව සමච්චල් කරමින් සිටියේ ද ඒ පිළිබඳ පුවත් ඔවුන් වෙත මතු පැමිණෙනු ඇත.

أَلَمْ يَرَوْا كَمْ أَهْلَكْنَا مِنْ قَبْلِهِمْ مِنْ قَرْنٍ مَكَّنَّاهُمْ فِي الْأَرْضِ مَا لَمْ نُمَكِّنْ لَكُمْ وَأَرْسَلْنَا السَّمَاءَ عَلَيْهِمْ مِدْرَارًا وَجَعَلْنَا الْأَنْهَارَ تَجْرِي مِنْ تَحْتِهِمْ فَأَهْلَكْنَاهُمْ بِذُنُوبِهِمْ وَأَنْشَأْنَا مِنْ بَعْدِهِمْ قَرْنًا آخَرِينَ (6)

ඔවුනට පෙර පරම්පරා ගණනාවක් අප කෙසේ විනාශ කර දැමුවේ දැ යි ඔවුහු නුදුටුවෝද ? නුඹලාට අප නොදුන් පහසුකම් අපි ඔවුනට මිහිතලයේ සලසා දුන්නෙමු. ඔවුන් වෙත අහස් ජලය නොකඩවා එව්වෙමු. ඔවුනට පහළින් ගලා බස්නා ගංගාවන් ඇති කළෙමු. පසුව ඔවුන්ගේ පාපකම් හේතුවෙන් අපි ඔවුන් ව විනාශ කළෙමු. තවද ඔවුනට පසුව අපි වෙනත් පරම්පරාවක් බිහි කළෙමු.

7-9. සත්‍යය පැහැදිලි ව තිබිය දී ප්‍රතික්ෂේපකයින් එය පිළිනොගෙන දඬබ්බරකම් පෑම හා වාද කිරීම

وَلَوْ نَزَّلْنَا عَلَيْكَ كِتَابًا فِي قِرْطَاسٍ فَلَمَسُوهُ بِأَيْدِيهِمْ لَقَالَ الَّذِينَ كَفَرُوا إِنْ هَذَا إِلَّا سِحْرٌ مُبِينٌ (7)

පත්‍රිකාවක ලියන ලද පුස්තකයක් අපි නුඹ වෙත පහළ කොට එය ඔවුන් ඔවුන්ගේ අත් වලින් ස්පර්ශ කර බැලුව ද මෙය පැහැදිලි හූනියමක් මිස නැතැයි ප්‍රතික්ෂේප කළවුන් පවසා සිටියහ.

وَقَالُوا لَوْلَا أُنْزِلَ عَلَيْهِ مَلَكٌ وَلَوْ أَنْزَلْنَا مَلَكًا لَقُضِيَ الْأَمْرُ ثُمَّ لَا يُنْظَرُونَ (8)

මොහු වෙත (සාක්ෂි දැරීම සඳහා) මලාඉකාවරයෙකු පහළ කරනු ලැබිය යුතු නොවේ දැ යි ඔවුහු පැවසූහ. එසේ අපි මලාඉකාවරයෙකු පහළ කළේ නම් (ඔවුන්ගේ) විෂය තීන්දු කරනු ලබනු ඇත. පසුව ඔවුනට අවකාශ දෙනු නොලබනු ඇත.

وَلَوْ جَعَلْنَاهُ مَلَكًا لَجَعَلْنَاهُ رَجُلًا وَلَلَبَسْنَا عَلَيْهِمْ مَا يَلْبِسُونَ (9)

අප එසේ මලාඉකාවරයෙකු පත් කළේ නම් මිනිසෙකුගේ ස්වරූපයෙන්ම ඔහු ව අපි පත් කරන්නෙමු. (දැන්) ඔවුන් ව්‍යාකූල ව සිටින අයුරින් ම (එවිට ද අප) ඔවුන් ව ව්‍යාකූලත්වයට පත් කරන්නෙමු.

10-11. ඉකුත් වී ගිය ජන සමාජයන්ගේ අවසාන ප්‍රතිඵලය දෙස බලා පාඩම් ඉගෙන ගන්නා ලෙස ප්‍රතික්ෂේප කරන්නන්ට ඇරයුම් කිරීම

وَلَقَدِ اسْتُهْزِئَ بِرُسُلٍ مِنْ قَبْلِكَ فَحَاقَ بِالَّذِينَ سَخِرُوا مِنْهُمْ مَا كَانُوا بِهِ يَسْتَهْزِئُونَ (10)

(නබිවරය !) නුඹට පෙර සිටි රසූල්වරුන් ද සමච්චලයට ගනු ලැබූහ. කවර දෙයක් සම්බන්ධ යෙන් ඔවුහු සමච්චල් කරමින් සිටියෝ ද එයම එසේ උපහාස කළ අය ව ග්‍රහණය කළේය.

قُلْ سِيرُوا فِي الْأَرْضِ ثُمَّ انْظُرُوا كَيْفَ كَانَ عَاقِبَةُ الْمُكَذِّبِينَ (11)

(නබිවරය!) මහපොළොවෙහි සැරිසරා පසුව බොරු කළවුන්ගේ අවසානය කෙසේ වී දැ යි අවධානයෙන් බලනු යැයි නුඹ පවසනු.

12-18. අල්ලාහ්ගේ ඒකීයත්වය ඔහුගේ ආධිපත්‍යය හා ඔහුගේ අසමසම කරුණා ව පිළිබඳ ව තහවුරු කිරීම

قُلْ لِمَنْ مَا فِي السَّمَاوَاتِ وَالْأَرْضِ قُلْ

අහස්හි හා මහපොළොවෙහි ඇති දෑ කවුරුන් සතු දැ යි නුඹ

لِلَّهِ كَتَبَ عَلَى نَفْسِهِ الرَّحْمَةَ لَيَجْمَعَنَّكُمْ إِلَى يَوْمِ الْقِيَامَةِ لَا رَيْبَ فِيهِ الَّذِينَ خَسِرُوا أَنْفُسَهُمْ فَهُمْ لَا يُؤْمِنُونَ (12)

අසනු. සියල්ල අල්ලාහ් සතුය යැයි පවසනු. (අල්ලාහ්) තමන් වෙත කරුණා ව නියම කර ගත්තේය. සැබැවින්ම මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දින ඔහු නුඹලා ව එක් රැස් කරනු ඇත. එහි කිසිදු සැකයක් නැත. තමන් තමන්ටම අලාභහානි කර ගත්තවුන් වන ඔවුහු විශ්වාස නොකරති.

وَلَهُ مَا سَكَنَ فِي اللَّيْلِ وَالنَّهَارِ وَهُوَ السَّمِيعُ الْعَلِيمُ (13)

තවද රාත්‍රියෙහි හා දහවලෙහි වාසය කරන දෑ ඔහු සතුය. තවද ඔහු සර්ව ශ්‍රාවකය. සර්ව ඥානීය.

قُلْ أَغَيْرَ اللَّهِ أَتَّخِذُ وَلِيًّا فَاطِرِ السَّمَاوَاتِ وَالْأَرْضِ وَهُوَ يُطْعِمُ وَلَا يُطْعَمُ قُلْ إِنِّي أُمِرْتُ أَنْ أَكُونَ أَوَّلَ مَنْ أَسْلَمَ وَلَا تَكُونَنَّ مِنَ الْمُشْرِكِينَ (14)

අල්ලාහ්ගෙන් තොරව (වෙනත් කෙනෙකු) භාරකරු වශයෙන් මම ගන්නෙම්ද? (ඔහු) අහස් හා මිහිතලයේ නිර්මාපකයාය. තවද ඔහු ආහාර සපයයි. (කිසිවෙකු විසින්) ඔහුට ආහාර සපයනු නොලැබේ යැයි නුඹ පවසනු. සැබැවින්ම (අල්ලාහ්ට) අවනත වූවන්ගෙන් මා පළමු වැන්නා වීමට මම අණ කරනු ලැබුවෙමි. තවද නුඹලා කිසිකලෙක ආදේශ තබන්නන් අතුරින් (කෙනෙකු) නොවනු.

قُلْ إِنِّي أَخَافُ إِنْ عَصَيْتُ رَبِّي عَذَابَ يَوْمٍ عَظِيمٍ (15)

මාගේ පරමාධිපතිට මා පිටුපෑවේ නම් අති මහත් දිනයේ (නියම වන) දඬුවමට මම බිය වෙමි යැයි පවසනු.

مَنْ يُصْرَفْ عَنْهُ يَوْمَئِذٍ فَقَدْ رَحِمَهُ وَذَلِكَ الْفَوْزُ الْمُبِينُ (16)

කවරෙකු එදින එයින් (එම දඬුවමින්) වෙනතකට යොමු කරනු ලබන්නේ ද එවිට සැබැවින්ම (අල්ලාහ්) ඔහුට

දයාව දැක්වීය. පැහැදිලි විජයග්‍රහණය එයයි.

وَإِنْ يَمْسَسْكَ اللَّهُ بِضُرٍّ فَلَا كَاشِفَ لَهُ إِلَّا هُوَ وَإِنْ يَمْسَسْكَ بِخَيْرٍ فَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ (17)

යම් හිංසනයකින් අල්ලාහ් ඔබ ව ග්‍රහණය කරන්නේ නම් එවිට ඔහු හැර එය ඉවත් කරන වෙනත් කිසිවෙකු නොමැත. යම් යහපතකින් ඔබ ව ග්‍රහණය කරන්නේ නම් එවිට ඔහු සියලු දෑ කෙරෙහි සර්ව බලධාරීය.

وَهُوَ الْقَاهِرُ فَوْقَ عِبَادِهِ وَهُوَ الْحَكِيمُ الْخَبِيرُ (18)

තම ගැත්තන්ට ඉහළින් සිට මැඩලන්නේ ඔහුය. තවද ඔහු ප්‍රඥාවන්තය (සියලු තොරතුරු) මැනවින් දන්නාය.

19-20. අල්ලාහ්ගේ ඒකත්වය හා දූත මෙහෙවර තහවුරු කිරීම හා දහම් ලත් ජනයා මුහම්මද් තුමාණන්ගේ නබිත්වය ගැන දැන සිටි බව තහවුරු කිරීම.

قُلْ أَيُّ شَيْءٍ أَكْبَرُ شَهَادَةً قُلِ اللَّهُ شَهِيدٌ بَيْنِي وَبَيْنَكُمْ وَأُوحِيَ إِلَيَّ هَذَا الْقُرْآنُ لِأُنْذِرَكُمْ بِهِ وَمَنْ بَلَغَ أَئِنَّكُمْ لَتَشْهَدُونَ أَنَّ مَعَ اللَّهِ آلِهَةً أُخْرَى قُلْ لَا أَشْهَدُ قُلْ إِنَّمَا هُوَ إِلَهٌ وَاحِدٌ وَإِنَّنِي بَرِيءٌ مِمَّا تُشْرِكُونَ (19)

(නබිවරය) සාක්ෂියේ වඩාත් ප්‍රබල වනුයේ කුමක් දැ යි නුඹ අසනු. මා අතර හා නුඹලා අතර සාක්ෂිකරු අල්ලාහ් වීම යැයි පවසනු. තවද මෙම කුර්ආනය මට වහී (දේව පණිවිඩ) වශයෙන් දෙනු ලැබීය. (එය) මෙමගින් නුඹලාට හා මෙය ලබන අයට මම අවවාද කරනු පිණිසය. අල්ලාහ් සමඟ වෙනත් දෙවියකු සිටිනු ඇතැයි සැබැවින්ම නුඹලා සාක්ෂි දරන්නෙහුද? (නැත. එලෙස) මට සාක්ෂි දැරිය නොහැකැයි නුඹ පවසනු. එකම දෙවියා ඔහු ම යැයි ද සැබැවින්ම මම නුඹලා ආදේශ තබන දැයින් නිදොස් යැයි ද නුඹ පවසනු.

الَّذِينَ آتَيْنَاهُمُ الْكِتَابَ يَعْرِفُونَهُ كَمَا يَعْرِفُونَ أَبْنَاءَهُمُ الَّذِينَ خَسِرُوا أَنْفُسَهُمْ فَهُمْ لَا يُؤْمِنُونَ (20)

කවරෙකුට අපි පුස්තකය පිරිනැමුවෙමු ද ඔවුහු තම දරුවන් හඳුනන්නාක් මෙන් මොහු (අල්ලාහ්ගේ දූතයාණන් බ)ව හඳුනති. තමන් තමන්ට ම අලාභහානි කර ගත්තවුන් වන ඔවුහු විශ්වාස නොකරති.

وَمَنْ أَظْلَمُ مِمَّنِ افْتَرَى عَلَى اللَّهِ كَذِبًا أَوْ كَذَّبَ بِآيَاتِهِ إِنَّهُ لَا يُفْلِحُ الظَّالِمُونَ (21)

අල්ලාහ් වෙත බොරු ගොතන්නන් හෝ ඔහුගේ වදන් බොරු කරන්නන්ට වඩා මහා අපරාධකරුවෝ කවරහු ද? සැබැවින්ම අපරාධකරුවන් ජය නොලබති.

21-26. කුර්ආනය හා වහී(දේව හෙළිදරව්) ව්‍යාජ යැයි පවසන අයගේ ස්ථාවරය හා මළවුන්ගෙන් නැගිටුවනු ලබන දිනයේ ඔවුන්ගේ දැඩි පසුතැවිල්ල.

وَيَوْمَ نَحْشُرُهُمْ جَمِيعًا ثُمَّ نَقُولُ لِلَّذِينَ أَشْرَكُوا أَيْنَ شُرَكَاؤُكُمُ الَّذِينَ كُنْتُمْ تَزْعُمُونَ (22)

තවද එදින ඔවුන් සියලු දෙනා අප එක් රැස් කොට පසුව නුඹලා තරයේ විශ්වාස කරමින් සිටි (අල්ලාහ්ට ආදේශ වශයෙන් ගත්) නුඹලාගේ හවුල්කරුවන් කොහේ දැ යි අපි ආදේශ කළවුන්ගෙන් විමසන්නෙමු.

ثُمَّ لَمْ تَكُنْ فِتْنَتُهُمْ إِلَّا أَنْ قَالُوا وَاللَّهِ رَبِّنَا مَا كُنَّا مُشْرِكِينَ (23)

පසුව අල්ලාහ් මත දිවුරා පවසන්නෙමු. අපගේ පරමාධිපතියාණනි! සැබැවින්ම අපි ආදේශ තබන්නන් ලෙස නොසිටියෙමු යැයි ඔවුහු පැවසීම හැර ඔවුන්ගේ අර්බුදය වෙනත් කිසිවක් නොවනු ඇත.

انْظُرْ كَيْفَ كَذَبُوا عَلَى أَنْفُسِهِمْ وَضَلَّ

(නබිවරය!) තමන්ට එරෙහි ව ඔවුහු බොරු පවසනුයේ කෙසේ

عَنْهُمْ مَا كَانُوا يَفْتَرُونَ (24)

දැ යි බලනු. ඔවුන් ගොතමින් සිටි දෑ ඔවුන් ව නොමඟ යැවීය.

وَمِنْهُمْ مَنْ يَسْتَمِعُ إِلَيْكَ وَجَعَلْنَا عَلَى قُلُوبِهِمْ أَكِنَّةً أَنْ يَفْقَهُوهُ وَفِي آذَانِهِمْ وَقْرًا وَإِنْ يَرَوْا كُلَّ آيَةٍ لَا يُؤْمِنُوا بِهَا حَتَّى إِذَا جَاءُوكَ يُجَادِلُونَكَ يَقُولُ الَّذِينَ كَفَرُوا إِنْ هَذَا إِلَّا أَسَاطِيرُ الْأَوَّلِينَ (25)

තවද ඔවුන් අතුරින් නුඹ වෙත සවන් දෙන (මෙන් රඟපාන) අය ද වෙති. එය ඔවුනට නොවැටහෙන පරිදි අපි ඔවුන්ගේ හදවත් මත ආවරණයක් ද ඔවුන්ගේ කන් තුළ බිහිරි බව ද ඇති කළෙමු. තවද ඔවුහු සියලු සාධක දුටුවද ඒවා ඔවුහු විශ්වාස නොකරති. නුඹ වෙත ඔවුහු පැමිණි විට නුඹ සමඟ ඔවුහු වාද කරනු ඇත. මෙය මුතුන් මිත්තන්ගේ ගෙතූ දෑ මිස නැතැයි ප්‍රතික්ෂේප කළවුන් පවසති.

وَهُمْ يَنْهَوْنَ عَنْهُ وَيَنْأَوْنَ عَنْهُ وَإِنْ يُهْلِكُونَ إِلَّا أَنْفُسَهُمْ وَمَا يَشْعُرُونَ (26)

තවද ඔවුහු එයින්(සත්‍යයෙන්) වළක්වාලති. ඔවුන් ද එයින් දුරස් ව සිටිති. ඔවුහු විනාශ කරනුයේ ඔවුන් ව ම මිස නැත. තවද ඔවුහු (ඒ බව) වටහා නොගනිති.

**27-32. කියාමත් දිනයේ විස්තර එදින ප්‍රතික්ෂේප කරන්නන්ගේ පසුතැවිල්ල හා මෙලොව හා පරලොව ජීවිතය අතර වූ වෙනස**

وَلَوْ تَرَى إِذْ وُقِفُوا عَلَى النَّارِ فَقَالُوا يَا لَيْتَنَا نُرَدُّ وَلَا نُكَذِّبَ بِآيَاتِ رَبِّنَا وَنَكُونَ مِنَ الْمُؤْمِنِينَ (27)

නිරා ගින්නෙහි ඔවුන් සිටුවා තබනු ලැබූ විට නුඹ දුටුවේ නම් එවිට ඔවුහු "අහෝ! අපගේ විනාශය, අප නැවත හරවා යවනු ලබන්නේ නම් ! (කෙතරම් හොඳ ද ! එවිට) අපි අපගේ පරමාධිපතිගේ වදන් බොරු නොකරන්නෙමු. තවද අපි විශ්වාසවන්තයින් අතුරින් වන්නෙමු යැ" යි පවසා සිටිති.

بَلْ بَدَا لَهُمْ مَا كَانُوا يُخْفُونَ مِنْ قَبْلُ وَلَوْ رُدُّوا لَعَادُوا لِمَا نُهُوا عَنْهُ وَإِنَّهُمْ لَكَاذِبُونَ (28)

නමුත් කලින් ඔවුන් සඟවමින් සිටි දෑ ඔවුනට හෙළි විය. තවද ඔවුන් නැවත හරවා යවනු ලැබුව ද කවර දෙයකින් ඔවුන් ව වළක්වනු ලැබුවේ ද ඒ වෙතටම හැරී යනු ඇත. තවද නියත වශයෙන්ම ඔවුහු බොරුකාරයෝය.

وَقَالُوا إِنْ هِيَ إِلَّا حَيَاتُنَا الدُّنْيَا وَمَا نَحْنُ بِمَبْعُوثِينَ (29)

තවද මෙය අපගේ ලෞකික ජීවිතය මිස නැත. තවද අප (මිය ගිය පසු) නැවත නැගිටුවනු ලබන්නන් නොවෙමු යැයි ඔවුහු පැවසුවෝය.

وَلَوْ تَرَى إِذْ وُقِفُوا عَلَى رَبِّهِمْ قَالَ أَلَيْسَ هَذَا بِالْحَقِّ قَالُوا بَلَى وَرَبِّنَا قَالَ فَذُوقُوا الْعَذَابَ بِمَا كُنْتُمْ تَكْفُرُونَ (30)

තවද ඔවුහු තම පරමාධිපති ඉදිරියේ සිටවනු ලැබූ විට නුඹ දකියි නම් මෙය සත්‍යය නොවේ දැ යි ඔහු විමසා සිටියි. අපගේ පරමාධිපතියාණන් මත දිවුරා පවසමු. (එය) එසේය යැයි පවසති. එසේ නම් නුඹලා ප්‍රතික්ෂේප කරමින් සිටි දෑ හේතුවෙන් මෙම දඬුවම නුඹලා භුක්ති විඳිනු යැයි ඔහු පවසනු ඇත.

قَدْ خَسِرَ الَّذِينَ كَذَّبُوا بِلِقَاءِ اللَّهِ حَتَّى إِذَا جَاءَتْهُمُ السَّاعَةُ بَغْتَةً قَالُوا يَا حَسْرَتَنَا عَلَى مَا فَرَّطْنَا فِيهَا وَهُمْ يَحْمِلُونَ أَوْزَارَهُمْ عَلَى ظُهُورِهِمْ أَلَا سَاءَ مَا يَزِرُونَ (31)

සැබැවින්ම අල්ලාහ් මුණ ගැසීම බොරු යැයි ප්‍රකාශ කළවුන් අලාභ වින්දහ. අවසන් හෝරාව අනපේක්ෂිත ව ඔවුන් වෙත පැමිණි විට ඔවුන් ඔවුන්ගේ (පාප) බර ඔවුන්ගේ පිට මත ඔසවා ගනිමින් අහෝ ! අපි මෙ(ලොවෙ)හි අතපසු කළ දෑ හි විනාශය ! යැයි පවසති. ඔවුන් ඔසවා ගන්නා දෑ නපුරු නොවේ

ද?

وَمَا الْحَيَاةُ الدُّنْيَا إِلَّا لَعِبٌ وَلَهْوٌ وَلَلدَّارُ الْآخِرَةُ خَيْرٌ لِلَّذِينَ يَتَّقُونَ أَفَلَا تَعْقِلُونَ (32)

මෙලොව ජීවිතය කෙළිලොල් හා පුහුවක් මිස නැත. මතු ලොව නිවහන දේව බිය හැඟීමෙන් කටයුතු කරන්නන්ට වඩාත් ශ්‍රේෂ්ඨය. නුඹලා (ඒ බව) වටහා ගත යුතු නොවේ ද?

33-35. ආදේශ තබන්නන්ගේ දඩබ්බරකම් හේතුවෙන් නබි තුමාට ඇති වූ කනස්සල්ල ගැන එතුමාණන් ව සැනසීම හා සෙසු නබිවරුන් පවා මෙවැනි කරදර වලට ඉවසීමෙන් යුතුව මුහුණු පෑ බව දන්වා සිටීම

قَدْ نَعْلَمُ إِنَّهُ لَيَحْزُنُكَ الَّذِي يَقُولُونَ فَإِنَّهُمْ لَا يُكَذِّبُونَكَ وَلَكِنَّ الظَّالِمِينَ بِآيَاتِ اللَّهِ يَجْحَدُونَ (33)

(නබිවරය !) ඔවුන් පවසන දෑ නුඹ දුකට පත් කරනු ඇතැයි සැබැවින්ම අපි දනිමු. සැබැවින්ම ඔවුහු නුඹ ව බොරු නොකළෝය. නමුත් අපරාධකරුවන් අල්ලාහ්ගේ වදන් පිටුපානු ඇත.

وَلَقَدْ كُذِّبَتْ رُسُلٌ مِنْ قَبْلِكَ فَصَبَرُوا عَلَى مَا كُذِّبُوا وَأُوذُوا حَتَّى أَتَاهُمْ نَصْرُنَا وَلَا مُبَدِّلَ لِكَلِمَاتِ اللَّهِ وَلَقَدْ جَاءَكَ مِنْ نَبَإِ الْمُرْسَلِينَ (34)

නුඹට පෙරද රසූල්වරුන් බොරු කරනු ලැබූහ. නමුත් අපගේ උදව් ව ඔවුන් වෙත පැමිණෙන තෙක් ඔවුන් බොරු කරනු ලැබූ දෑ හා ඔවුන් හිංසා පීඩාවට ලක් වූ දෑ ඉවසා දරා ගත්හ. අල්ලාහ්ගේ වදන් වෙනස් කරන්නකු නොමැත. තවද සැබැවින්ම රසූල්වරුන්ගේ තොරතුරු ඔබ වෙත පැමිණ ඇත.

وَإِنْ كَانَ كَبُرَ عَلَيْكَ إِعْرَاضُهُمْ فَإِنِ اسْتَطَعْتَ أَنْ تَبْتَغِيَ نَفَقًا فِي الْأَرْضِ

ඔවුන්ගේ පිටුපෑම නුඹ වෙත දරුණු වූයේ නම් එවිට මහපොළොවෙහි උමගක් සොයා හෝ අහසින් ඉණිමඟක්

أَوْ سُلَّمًا فِي السَّمَاءِ فَتَأْتِيَهُمْ بِآيَةٍ وَلَوْ شَاءَ اللَّهُ لَجَمَعَهُمْ عَلَى الْهُدَى فَلَا تَكُونَنَّ مِنَ الْجَاهِلِينَ (35)

තබා ඔවුන් වෙත (එසේ) සාධකයක් රැගෙන ඒමට ඔබ හැකියාව දැරුවද (ඔවුන් පිටුපාමින්ම සිටිති.) තවද අල්ලාහ් කැමති වූයේ නම් (එවිට ද) යහමඟ මත ඔවුන් ව රැස් කරන්නට තිබුණි. එබැවින් නුඹ අඥානයින් අතුරින් නොවනු.

36-39. අල්-කුර්ආනය විශ්වාසවන්තයින්ට මඟපෙන්වීමක් හා ප්‍රතිකාරකයක් වේ. නමුත් ප්‍රතික්ෂේප කරන්නෝ එය ශ්‍රවණය නොකරන අතර වටහා ගන්නේද නැත.

إِنَّمَا يَسْتَجِيبُ الَّذِينَ يَسْمَعُونَ وَالْمَوْتَى يَبْعَثُهُمُ اللَّهُ ثُمَّ إِلَيْهِ يُرْجَعُونَ (36)

(ඔබගෙන්) පිළිතුරු පතනුයේ ශ්‍රවණය කරන්නන් වෙති. මියගිය ඇත්තන් අල්ලාහ් නැවත නැගිටුවා පසුව ඔහු වෙතට ඔවුහු යොමු කරනු ලබති.

وَقَالُوا لَوْلَا نُزِّلَ عَلَيْهِ آيَةٌ مِنْ رَبِّهِ قُلْ إِنَّ اللَّهَ قَادِرٌ عَلَى أَنْ يُنَزِّلَ آيَةً وَلَكِنَّ أَكْثَرَهُمْ لَا يَعْلَمُونَ (37)

තවද (අප කැමති පරිදි) ඔහුගේ පරමාධිපතිගෙන් ඔහු වෙත සාධකයක් පහළ කරනු ලැබිය යුතු නොවේ දැ යි විමසති. (නබිවරය !) සැබැවින්ම අල්ලාහ් එසේ සාධකයක් පහළ කිරීමට ශක්තිවන්තය. නමුත් ඔවුන් ගෙන් බොහෝ දෙනා (ඒ බව) නොදනිති.

وَمَا مِنْ دَابَّةٍ فِي الْأَرْضِ وَلَا طَائِرٍ يَطِيرُ بِجَنَاحَيْهِ إِلَّا أُمَمٌ أَمْثَالُكُمْ مَا فَرَّطْنَا فِي الْكِتَابِ مِنْ شَيْءٍ ثُمَّ إِلَى رَبِّهِمْ يُحْشَرُونَ (38)

ගොඩබිම සතෙකු හෝ වේවා තම තටු දෙක සලමින් පියාසර කරන පක්ෂියකු හෝ වේවා (උන් ද) නුඹලා මෙන් වූ සමූහයක් මිස නැත. පුස්තකයේ අපි කිසිවක් අත් නොහැරියෙමු. පසුව ඔවුන්ගේ පරමාධිපති වෙතට එක් රැස් කරනු ලබති.

وَالَّذِينَ كَذَّبُوا بِآيَاتِنَا صُمٌّ وَبُكْمٌ فِي الظُّلُمَاتِ مَنْ يَشَإِ اللَّهُ يُضْلِلْهُ وَمَنْ يَشَأْ يَجْعَلْهُ عَلَى صِرَاطٍ مُسْتَقِيمٍ (39)

අපගේ වදන් බොරු කළවුන් අන්ධකාරයන්හි බිහිරන් හා ගොළුවන් වෙති. අල්ලාහ් අභිමත කරන අය නොමඟ යන්නට ඉඩ හරියි. ඔහු අභිමත කරන අය ඍජු මාර්ගය මත තබයි.

40-41. අසීරු අවස්ථා වල අල්ලාහ් වෙතට මිනිසුන් නැඹුරු වීම හා ප්‍රතික්ෂේපකයින් පවා ඔහු වෙතට යොමු වීම ස්වභාවයකි.

قُلْ أَرَأَيْتَكُمْ إِنْ أَتَاكُمْ عَذَابُ اللَّهِ أَوْ أَتَتْكُمُ السَّاعَةُ أَغَيْرَ اللَّهِ تَدْعُونَ إِنْ كُنْتُمْ صَادِقِينَ (40)

(නබිවරය) ‘නුඹලා වෙත අල්ලාහ්ගේ එය අපවිත්‍ර නොවන බව ඔබ දන්නා තාක් කල් දේව ප්‍රතික්ෂේපකයින්ගේ භාජන භාවිත කිරීමට අනුමැතිය ඇත. නුඹලා සත්‍යවාදීන් ව සිටියෙහු නම් දඬුවම පැමිණියේ නම් හෝ නුඹලාට අවසන් හෝරාව පැමිණියේ නම් හෝ (උදව් සඳහා) අල්ලාහ් නොවන (වෙනත්) අයෙකු අයැද සිටීම ගැන නුඹලා කුමක් සිතන්නෙහු දැ?යි (ඔවුන්ගෙන්) විමසනු.

بَلْ إِيَّاهُ تَدْعُونَ فَيَكْشِفُ مَا تَدْعُونَ إِلَيْهِ إِنْ شَاءَ وَتَنْسَوْنَ مَا تُشْرِكُونَ (41)

එසේ නොව, නුඹලා අයැදින්නේ ඔහුවමය. නුඹලා ඔහු වෙත අයැද සිටින දෑ ඔහු අභිමත කළේ නම් ඉවත් කරනු ඇත. තවද නුඹලා ද ආදේශ කරන දෑ අමතක කර දමනු ඇත.

42-45. විපත් හා දුක්කම්කටොළු වල යථාර්ථය හා යහපත. අල්ලාහ්ගේ අනුග්‍රහයන් හා ජීවන සම්පත් මිනිසුන්ට පරීක්ෂණයක් වීම

وَلَقَدْ أَرْسَلْنَا إِلَى أُمَمٍ مِنْ قَبْلِكَ

තවද සැබැවින්ම අපි නුඹට පෙර

فَأَخَذْنَاهُمْ بِالْبَأْسَاءِ وَالضَّرَّاءِ لَعَلَّهُمْ يَتَضَرَّعُونَ (42)

වූ සමූහයන් වෙත ද දූත පණිවිඩ එව්වෙමු. ඔවුන් යටහත් පහත් විය හැකි වනු පිණිස දුෂ්කරතාවන් හා පීඩාවන්ගෙන් ඔවුන් ව හසු කළෙමු.

فَلَوْلَا إِذْ جَاءَهُمْ بَأْسُنَا تَضَرَّعُوا وَلَٰكِنْ قَسَتْ قُلُوبُهُمْ وَزَيَّنَ لَهُمُ الشَّيْطَانُ مَا كَانُوا يَعْمَلُونَ (43)

එබැවින් ඔවුන් වෙත අපගේ දුෂ්කරතාවන් පැමිණි විට ඔවුන් යටහත් පහත් විය යුතු නොවේ ද? නමුත් ඔවුන්ගේ හදවත් දැඩි විය. ඔවුන් කරමින් සිටි දෑ ෂෙයිතාන් ඔවුන්ට අලංකාරවත් කළේය.

فَلَمَّا نَسُوا مَا ذُكِّرُوا بِهِ فَتَحْنَا عَلَيْهِمْ أَبْوَابَ كُلِّ شَيْءٍ حَتَّىٰ إِذَا فَرِحُوا بِمَا أُوتُوا أَخَذْنَاهُمْ بَغْتَةً فَإِذَا هُمْ مُبْلِسُونَ (44)

කවර දෙයක් පිළිබඳ ඔවුනට මෙනෙහි කරනු ලැබුවේ ද එය ඔවුහු අමතක කළ කල්හි (ප්‍රථමයෙන්) අපි සියලු දෑ හි දොරටු ඔවුන් වෙත විවෘත කළෙමු. අවසානයේ ඔවුනට දෙනු ලැබූ දෑ පිළිබඳ සතුටු වෙමින් සිටිය දී අපි ඔවුන් ව අනපේක්ෂිත ව හසු කළෙමු. එවිට ඔවුහු (සියලු කටයුතු වලදී) අසාර්ථක වූවන් බවට පත් වූහ.

فَقُطِعَ دَابِرُ الْقَوْمِ الَّذِينَ ظَلَمُوا وَالْحَمْدُ لِلَّهِ رَبِّ الْعَالَمِينَ (45)

පසුව අපරාධ කළවුන්ගේ මුල කපා හරිනු ලැබීය. තවද සියලු ප්‍රශංසා සියලු ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ් සතුය.

### 46-49. අවවාද කිරීම, මර්දනය කිරීම හා ඒකීයත්වය පිළිබඳ ව වූ සාක්ෂීන්

قُلْ أَرَأَيْتُمْ إِنْ أَخَذَ اللَّهُ سَمْعَكُمْ وَأَبْصَارَكُمْ وَخَتَمَ عَلَىٰ قُلُوبِكُمْ مَنْ إِلَٰهٌ

අල්ලාහ් නුඹලාගේ සවන් හා නුඹලාගේ බැල්ම අත්පත් කර ගෙන නුඹලාගේ හදවත් මත මුද්‍රා තැබුවේ නම් එය නුඹලාට

غَيْرُ اللَّهِ يَأْتِيكُمْ بِهِ انْظُرْ كَيْفَ نُصَرِّفُ الْآيَاتِ ثُمَّ هُمْ يَصْدِفُونَ (46)

(නැවත) ගෙන එන්නට අල්ලාහ් නොවන වෙනත් දෙවිදෙකු සිටින්නේ දැ යි නුඹලා දැනුම් දෙන්නැයි (නබිවරය!) නුඹ අසනු. එම සාධක අපි කෙසේ විස්තර කරන්නේ දැ යි අවධානයෙන් බලනු. පසුව ද ඔවුන් පිටුපාන්නන් වෙති.

قُلْ أَرَأَيْتَكُمْ إِنْ أَتَاكُمْ عَذَابُ اللَّهِ بَغْتَةً أَوْ جَهْرَةً هَلْ يُهْلَكُ إِلَّا الْقَوْمُ الظَّالِمُونَ (47)

නුඹලා වෙත අල්ලාහ්ගේ දඬුවම අනපේක්ෂිත ව හෝ හෙළිපිට ම පැමිණියේ නම් අපරාධකාර ජනයා හැර වෙනත් කවරෙකු විනාශ කරනු ලබන්නේ දැ?' යි නුඹලා මට දැනුම් දෙන්නැ'යි නුඹ පවසනු.

وَمَا نُرْسِلُ الْمُرْسَلِينَ إِلَّا مُبَشِّرِينَ وَمُنْذِرِينَ فَمَنْ آمَنَ وَأَصْلَحَ فَلَا خَوْفٌ عَلَيْهِمْ وَلَا هُمْ يَحْزَنُونَ (48)

තවද ශුභාරංචි දන්වන්නන් හා අවවාද කරන්නන් වශයෙන් මිස අපි රසූල්වරුන් ව නොඑව්වෙමු. එබැවින් කවරෙකු විශ්වාස කොට හැඩ ගැසෙන්නේද ඔවුනට කිසිඳු බියක් නොමැත. තවද ඔවුහු දුකට පත්වන්නෝද නොවෙති.

وَالَّذِينَ كَذَّبُوا بِآيَاتِنَا يَمَسُّهُمُ الْعَذَابُ بِمَا كَانُوا يَفْسُقُونَ (49)

තවද අපගේ වදන් බොරු කළවුන් වන ඔවුනට ඔවුන් කරමින් සිටි පාපකම් හේතුවෙන් දඬුවම් අත් වනු ඇත.

50-55. නබිතුමාගේ මෙහෙවර වනුයේ ප්‍රචාරය කිරීම පමණි. තවද එතුමාට ගුප්ත දෑ ගැන දැනුමක් නැත. දුබල විශ්වාස වන්තයින් සමඟ කරුණාවෙන් හැසිරෙන ලෙස එතුමාට දැනුම් දීම

قُلْ لَا أَقُولُ لَكُمْ عِنْدِي خَزَائِنُ اللَّهِ

අල්ලාහ්ගේ සම්පත් මා වෙත තිබෙන බව මම නුඹලාට නොපවසමි. තවද මම ගුප්ත දෑ

وَلَا أَعْلَمُ الْغَيْبَ وَلَا أَقُولُ لَكُمْ إِنِّي مَلَكٌ إِنْ أَتَّبِعُ إِلَّا مَا يُوحَى إِلَيَّ قُلْ هَلْ يَسْتَوِي الْأَعْمَى وَالْبَصِيرُ أَفَلَا تَتَفَكَّرُونَ (50)

නොදනිමි. මම මලාඉකාවරයකු ද නොවෙමි, මා වෙත හෙළිදරව් කරනු ලබන දෑ හැර වෙනත් කිසිවක් මම පිළි නොපදිමි යැයි මම නුඹලාට නොපවසමි යැයි (නබිවරය ඔවුනට) නුඹ පවසනු. අන්ධයා හා බැල්මැත්තා එක සමාන වන්නේ ද? එබැවින් නුඹලා වටහා නොගන්නෙහු දැ?යි ද නුඹ පවසනු.

وَأَنْذِرْ بِهِ الَّذِينَ يَخَافُونَ أَنْ يُحْشَرُوا إِلَى رَبِّهِمْ لَيْسَ لَهُمْ مِنْ دُونِهِ وَلِيٌّ وَلَا شَفِيعٌ لَعَلَّهُمْ يَتَّقُونَ (51)

තවද තම පරමාධිපති වෙත එක් රැස් කරනු ලැබීම ගැන බියවන්නන් හට මෙමගින් නුඹ අවවාද කරනු. ඔවුන් බිය හැඟීමෙන් යුක්ත විය හැකි වනු පිණිසය. ඔහු හැර ඔවුනට භාරකරුවකු හෝ මැදිහත්වන්නෙකු හෝ නොමැත.

وَلَا تَطْرُدِ الَّذِينَ يَدْعُونَ رَبَّهُمْ بِالْغَدَاةِ وَالْعَشِيِّ يُرِيدُونَ وَجْهَهُ مَا عَلَيْكَ مِنْ حِسَابِهِمْ مِنْ شَيْءٍ وَمَا مِنْ حِسَابِكَ عَلَيْهِمْ مِنْ شَيْءٍ فَتَطْرُدَهُمْ فَتَكُونَ مِنَ الظَّالِمِينَ (52)

උදේ සවස තම පරමාධිපතිට ඔහුගේ තෘප්තිය අපේක්ෂාවෙන් ඇරයුම් කරන්නන් ව නුඹ පලවා නොහරිනු. ඔවුන්ගේ විනිශ්ච යෙන් කිසිවක් නුඹ වෙත නොපැවරෙනු ඇත. එමෙන්ම නුඹගේ විනිශ්චයෙන් කිසිවක් ඔවුන් වෙත ද නොපැවරෙනු ඇත. එබැවින් නුඹ ඔවුන් ව පලවා හරින්නේ නම් එවිට නුඹ අපරාධකරුවන් අතුරින් වන්නෙහිය.

وَكَذَلِكَ فَتَنَّا بَعْضَهُمْ بِبَعْضٍ لِيَقُولُوا أَهَؤُلَاءِ مَنَّ اللَّهُ عَلَيْهِمْ مِنْ بَيْنِنَا

තවද අප අතුරින් තමන් වෙත අල්ලාහ් ආශිර්වාද කළ අය මොවුන් දැ යි ඔවුන් පවසනු

أَلَيْسَ اللَّهُ بِأَعْلَمَ بِالشَّاكِرِينَ (53)

පිණිස ඔවුන්ගෙන් ඇතැමෙකු ව ඇතැමෙකු විසින් අප පරීක්ෂාවට ලක් කළේ එලෙසය. කෘතවේදීන් පිළිබඳ ව මැනවින් දන්නා අල්ලාහ් නොවේ ද?

وَإِذَا جَاءَكَ الَّذِينَ يُؤْمِنُونَ بِآيَاتِنَا فَقُلْ سَلَامٌ عَلَيْكُمْ كَتَبَ رَبُّكُمْ عَلَى نَفْسِهِ الرَّحْمَةَ أَنَّهُ مَنْ عَمِلَ مِنْكُمْ سُوءًا بِجَهَالَةٍ ثُمَّ تَابَ مِنْ بَعْدِهِ وَأَصْلَحَ فَأَنَّهُ غَفُورٌ رَحِيمٌ (54)

තවද අපගේ වදන් විශ්වාස කරන අය නුඹ වෙත පැමිණි විට නුඹලාට සලාම් (ශාන්තිය) යැයි නුඹ (ඔවුනට) පවසනු. නුඹලාගේ පරමාධිපති තමන් කෙරෙහි කරුණාව නියම කර ගත්තේය. නියත වශයෙන්ම නුඹලා අතුරින් කවරෙක් නොදැනුවත්කමින් යම් නපුරක් කොට ඉන් පසුව පසුතැවිලි වී හැඩ ගැසුණේද එවිට සැබැවින්ම ඔහු (අල්ලාහ්) අති ක්ෂමාශීලීය. මහා කරුණා ගුණයෙන් යුක්තය.

وَكَذَلِكَ نُفَصِّلُ الْآيَاتِ وَلِتَسْتَبِينَ سَبِيلُ الْمُجْرِمِينَ (55)

තවද වැරදිකරුවන්ගේ මඟ නුඹට පැහැදිලි වනු පිණිස එම වදන් අප පැහැදිලි කරනුයේ එලෙසය.

56-59. විනිශ්චය කිරීමේ බලය අල්ලාහ් සතුය. ගුප්ත දෑ පිළිබඳ ව අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු නොදනියි.

قُلْ إِنِّي نُهِيتُ أَنْ أَعْبُدَ الَّذِينَ تَدْعُونَ مِنْ دُونِ اللَّهِ قُلْ لَا أَتَّبِعُ أَهْوَاءَكُمْ قَدْ ضَلَلْتُ إِذًا وَمَا أَنَا مِنَ الْمُهْتَدِينَ (56)

අල්ලාහ් හැර නුඹලා අයැදින දෑ මා නැමදීමට සැබැවින්ම මම තහනම් කරනු ලද්දෙමි යැයි (නබිවරය) නුඹ පවසනු. තවද නුඹලාගේ ආශාවන් මම පිළි නොපදිමි. එවිට (එසේ කළේ නම්) මම නොමඟ යමි. තවද මම යහමඟ ලැබූවන් අතුරින් (කෙනෙකු) ද නොවෙමි යැයි

නුඹ පවසනු.

قُلْ إِنِّي عَلَى بَيِّنَةٍ مِنْ رَبِّي وَكَذَّبْتُمْ بِهِ مَا عِنْدِي مَا تَسْتَعْجِلُونَ بِهِ إِنِ الْحُكْمُ إِلَّا لِلَّهِ يَقُصُّ الْحَقَّ وَهُوَ خَيْرُ الْفَاصِلِينَ (57)

සැබැවින්ම මම මාගේ පරමාධිපතිගෙන් වූ පැහැදිලි සාධකයක් මත සිටිමි. නමුත් නුඹලා එය බොරු කළෙහුය. නුඹලා කවර දෙයක් ඉක්මන් කරන්නැ යි ඉල්ලා සිටින්නේ ද සැබැවින්ම එය මා සතු ව නැත. නීතිය අල්ලාහ් හැර වෙනත් කිසිවකු සතු නැත. ඔහු සත්‍යය පවසයි. තවද ඔහු තීන්දු පිරිනමන්නන්ගෙන් වඩා ශ්‍රේෂ්ඨය.

قُلْ لَوْ أَنَّ عِنْدِي مَا تَسْتَعْجِلُونَ بِهِ لَقُضِيَ الْأَمْرُ بَيْنِي وَبَيْنَكُمْ وَاللَّهُ أَعْلَمُ بِالظَّالِمِينَ (58)

“නුඹලා කවර දෙයක් ඉක්මන් කරන්නැ යි ඉල්ලා සිටින්නෙහු ද එය මා සතු ව ඇත්නම් මා අතර හා නුඹලා අතර විෂයය තීන්දු කරනු ලබන්නට තිබුණි. තවද අල්ලාහ් අපරාධකරුවන් පිළිබඳ මැනවින් දන්නාය යැයි’ නුඹ පවසනු

وَعِنْدَهُ مَفَاتِحُ الْغَيْبِ لَا يَعْلَمُهَا إِلَّا هُوَ وَيَعْلَمُ مَا فِي الْبَرِّ وَالْبَحْرِ وَمَا تَسْقُطُ مِنْ وَرَقَةٍ إِلَّا يَعْلَمُهَا وَلَا حَبَّةٍ فِي ظُلُمَاتِ الْأَرْضِ وَلَا رَطْبٍ وَلَا يَابِسٍ إِلَّا فِي كِتَابٍ مُبِينٍ (59)

ගුප්ත දෑ හි යතුරු ඔහු සතු ව ඇත. ඔහු හැර වෙනත් කිසිවකු ඒවා නොදනී. තවද ගොඩබිම හා මුහුදේ ඇති දෑ ඔහු දනී. ශාකයක කොළයක් පවා ඔහුගේ දැනුමෙන් තොරව නොවැටෙයි. තවද මහපොළොව අන්ධකාරය තුළ ඇති බීජය තෙතමනය හෝ වියළිභාවය පැහැදිලි පුස්තකයේ සඳහන් ව මිස නැත.

IslamHouse.com